අලව්ව ප්‍රාදේශීය සභාව - 2024
----

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

අලව්ව ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට අලව්ව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන්, ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු

කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව, විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී, වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වා ගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන ගිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති කාබනික පොහොර ඉතිරි තොග වටිනාකම රු.181,410 ක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස සලකා ගිණුම්ගත කර තිබුණි.	නිෂ්පාදන ගිණුමක් සකස් නොකිරීම හේතුවෙන් උපචිත පදනම මත අදාල පොහොර තොගය වර්ෂය තුළ විකුණුම් ලෙස සලකා ගිණුම් තැබීම සිදු කල බව.	නිවැරදිව ගිණුම් පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	නව මහරච්චිමුල්ල උප කාර්යාල ගොඩනැගිල්ලේ පසුගිය වර්ෂයේ දී සිදුකල රු.616,312 ක වැඩි දියුණු කිරීම ගිණුම්ගත කර තිබියදී එකී වියදම සමාලෝචිත වර්ෂයේ දීද ප්‍රග්ධනිත කර තිබුණි.	2025 වර්ෂයේ නිවැරදි කිරීමට කටයුතු කරන බව.	නිවැරදිව ගිණුම් පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	සමාලෝචිත වර්ෂයට අදාල ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු.9,888,993 ක් වුවත් එය රු.11,484,693ක් ලෙස රු.1,595,700 කින් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයට අදාළ ලැබිය යුතු උසාවි දඩ රු.380,500 ක වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.	2025 වර්ෂයේ නිවැරදි කිරීමට කටයුතු කරන බව.	නිවැරදිව ගිණුම් පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය.
(ඈ)	ආණ්ඩුකාරවර අනුමැතිය ලැබී තිබුණු නමුත් 2024 වර්ෂයේ ක්‍රියාත්මක නොකළ ව්‍යාපෘති 03 ක රු.476,225 ක වටිනාකම සහ ආණ්ඩුකාරවර අනුමැතිය ලැබී නොතිබුණු රු.25,000 ක රෝගී ආධාර වියදම් ණය හිමි යටතේ ගිණුම්ගත කර තිබුණි.	ආණ්ඩුකාර අනුමැතිය ලැබි ඇති වැඩසටහන් 2025 වර්ෂයේ ණයහිමි යටතේ ඉටුකිරීමටත් අනුමැතිය නොමැති රෝගි ආධාර වැඩසටහන් 2025 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදි ණයහිමි වලින් ඉවත් කීරීමටත් කටයුතු කරන බව.	ණයහිමියන් හඳුනා ගැනීම නිවැරදිව සිදුකල යුතුය.

1.6.2 නොසැසඳුණු පාලන ගිණුම් හෝ වාර්තා

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව පුස්තකාල පොත් වටිනාකම රු.7,122,311 ක් වුවත් උපලේඛන අනුව එම වටිනාකම රු.7,258,011 ක් විය. ඒ අනුව රු.135,700 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය.	2025 වර්ෂයේ නිවැරදි කිරීමට කටයුතු කරන බව.	උපලේඛන නිවැරදිව පිළියෙල කර ඒ අනුව ගිණුම් පිළියෙල කල යුතුය.

1.7 අනුකූල නොවීම

1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

	නීති , රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2018 අංක 19 දරණ ජාතික විගණන පනත VII වන පරිච්ඡේදයේ 38(2) වගන්තිය	මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වාගෙන යනු ලබන බවටත් එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳ කලින් කළ සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කර ඇති බවටත් ප්‍රධාන ගණන් දීමේ නිලධාරී විසින් ඉටුකළ යුතු ලිඛිත සමාලෝචනයේ පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2025 වර්ෂයේ නිවැරදි කිරීමට කටයුතු කරන බව.	මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වාගෙන යා යුතුය.
(ආ)	2018 දෙසැම්බර් 31 දිනැති අංක 04/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය අනුව සහ 2023 අගෝස්තු 07 දිනැති අංක ව. ප. පා. දෙ / 2 / 10 / 11 දරන පළාත් පාලන කොමසාරිස් (වයඹ) ගේ ලිපිය	සභාව සතු වත්කම් රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් හෝ පළාත් පාලන ආයතනයට බලපවත්නා පනතේ වත්කම් ප්‍රත්‍යාගණන සම්බන්ධයෙන් වන විධි විධාන අනුව කමිටු පත්කර ඉඩම් සහ ගොඩනැගිලි ඇතුළු සියලුම වත්කම් තක්සේරු කළ යුතු වුවත් සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කර නොතිබුණි.	2025 වසරේදී ඉඩම් සහ ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කරන බව.	වත්කම් කළමනාකරණ චක්‍රලේඛය අනුව ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය			
(i)	3.4.3 (ඇ)	ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිලදීගැනීම් කිරීමට ප්‍රසම්පාදන කමිටුව තීරණය කර තිබියදී ලිපිද්‍රව්‍ය මිලට ගැනීම සඳහා ලියාපදිංචි නොවූ සැපයුම්කරුවන් තිදෙනෙකුගෙන් මිලගණන් කැඳවා තිබුණි.	සභා බල ප්‍රදේශයට අවස්ථාවක් ලබා දීමේ අරමුණු ඇතිව නගරයේ පොත් වෙළඳ ආයතන දෙකකින් මිල ගණන් ලබා ගන්නා ලද බව.	2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය.

(ii)	5.6.1 (අ)	ප්‍රසම්පාදනය කිරීමට ඇති භාණ්ඩ හෝ වැඩ සඳහා වන පිරිවිතර අදාළ ප්‍රසම්පාදන අරමුණ සාක්ෂාත් කරගැනීම සඳහා අවශ්‍ය ප්‍රමාණයට වඩා පටු ආකාරයට විස්තර නොකළ යුතු වුවත් 2024 මාර්තු ටයිල් මිලදී ගැනීම සඳහා සුදුසු පිරිවිතර සකස් කිරීමේදී ඒ අනුව කටයුතු කර නොතිබුණි.	තාක්ෂණික ඇස්තමේන්තුවට අනුව 2"x 2" ප්‍රමාණයේ ටයිල් ප්‍රසම්පාදනයට ඉල්ලීමක් කල අතර , අස්ථිත්වයේ තීරණයට අනුව වර්ණය තීරණය කෙරිණි.	2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය.
(ඇ)	2018 ජනවාරි 26 දිනැති අංක 02/2018 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය			
	03 වන වගන්තිය හා 05 වන වගන්තිය	චක්‍රලේඛය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කර නොතිබීම සහ ධූරාවලියේ එක් එක් තලය සඳහා අනන්‍ය වූ නිපුණතා ඉලක්ක සපුරා ගැනීම සඳහා සුදුසු ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම කෙරෙහි සභාවේ අවධානය යොමුව නොතිබුණි.	ඉදිරියේදි මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කිරීමට හා ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලබන බව.	චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.29,135,458 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,171,327 ක් විය.

2.2 මූල්‍ය පාලනය

විගණන නිරීක්ෂණය	ලේකම්ගේ අදහස් දැක්වීම	නිර්දේශය
සභාව සතු බැංකු ජංගම ගිණුමේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනය අනුව මුදල් ශේෂය රු.27,353,959 ක් වුවත් එදිනට පිළියෙල කළ බැංකු සැසඳුම් ප්‍රකාශනයේ මුදල් ශේෂය රු.27,586,495 ක් විය. දීර්ඝ කාලයක සිට පැවත එන රු.232,536 ක වෙනස හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	2025 ගිණුම් සකස් කිරීමේදි නිවැරදි කිරිමට කටයුතු කරන බව.	වෙනසට හේතුව හඳුනාගෙන නිවැරදි කිරීමට ක්‍රියා කළ යුතුය.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ලේඛම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

		2024 වර්ෂය				2023 වර්ෂය			
	ආදායම් ප්‍රභවය	ඇස්තමේන්තු ආදායම	බිල්කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය	ඇස්තමේන්තු ආදායම	බිල්කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය
		(රු.000)	(රු.000)	(රු.000)	(රු.000)	(රු.000)	(රු.000)	(රු.000)	(රු.000)
(i)	වරිපනම් හා බදු	8,260	8,203	8,262	1,951	8,071	7,941	6,892	1,050
(ii)	කුලී	13,075	12,888	13,040	55	10,787	1,149	947	201
(iii)	බලපත්‍ර ගාස්තු	1,035	760	760	-	1,020	881	881	-
(iv)	වෙනත් ආදායම්	52,237	44,230	44,230	-	89,437	37,084	37,084	-
		--------	---------	---------	---------	--------	--------	--------	----------
	එකතුව	74,607	66,081	66,292	2,006	109,315	47,055	45,804	1,251
		======	======	======	=====	======	======	======	======

2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ආදායම් ඇස්තමේන්තු සකස් කිරීමේදී ලඟා කර ගැනීමට හැකිවන පරිදි තාත්විකව සැකසීම සිදුකළ යුතු වුවත් ඇස්තමේන්තු කළ ආදායමෙන් සියයට 12 ක් පමණ බිල් කිරීම සිදුකර නොතිබුණි.	ඇස්තමේන්තු ආදායමින් සියයට 12 ක පමණ මුදලක් බිල් නොකිරීම තුල ආදායම අඩු වී ඇති අතර ඉදිරියේදී ඇස්තමේන්තුව බිල් කිරීමට කටයුතු කරන බව.	තාත්විකව ඇස්තමේන්තු සකස් කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයේ බිල්කළ ආදායමට පසුගිය වර්ෂයේ අවසාන හිඟ ආදායම එකතු කර රැස්කළ ආදායම අඩුකල පසු දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම ලැබිය යුතු වුවද ඉදිරිපත් කළ දත්ත අනුව මෙම සංඛ්‍යා අතර පරස්පරතාවයක් පවතින බව නිරීක්ෂණය කෙරේ.	ඉදිරිපත් කර ඇති තොරතුරුවල පවතින පරස්පරතාවය නිවැරදි කර ඉදිරිපත් කරන බව.	නිවැරදි දත්ත ඉදිරිපත් කළ යුතුය.
(ඇ)	**වරිපනම් බදු**		
(i)	2024 ජනවාරි 01 දිනට පැවති වරිපනම් හිග ශේෂය වන රු.1,955,158 න් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.768,285 ක් සහ සමාලෝචිත වර්ෂයේ බිල් කළ රු.4,573,780 න් රු.1,122,579 ක් ලෙස රු.1,890,864 ක මුදලක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිග හිටව පැවතුණි.	ඉදිරියේදී අය කර ගැනිමට කටයුතු කරන බව.	හිඟ ආදායම් අප්‍රමාදීව අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

(ii)	වයඹ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ 2010 අගෝස්තු 17 දිනැති අංක 2010/02 දරන චක්‍රලේඛයේ 05 වන පරිච්ඡේදයේ (viii) වන ඡේදය ප්‍රකාරව, වර්ෂ 05 කට වරක් තක්සේරු වරිපනම් බදු ප්‍රතිශෝධනය කල යුතු අතර දීර්ඝ කාලයක් මුළුල්ලේ ප්‍රතිශෝධනයක් නොකළ බදු හෝ ගාස්තු පිළිබඳව සභාවේ කඩිනම් අවධානය යොමු කළ යුතු වුවද, එලෙස වරිපනම් තක්සේරුවක් සිදුකර නොතිබුණි. ඒ හේතුවෙන් සභාවට ලැබිය යුතු විශාල ආදායමක් අහිමි වී තිබුණි.	2021 වර්ෂයේ තක්සේරුව වන අතර නැවත තක්සේරුවක් සඳහා අත්තිකාරම් මුදල් ලෙස තක්සේරු දෙපාර්තමේන්තුව වෙත 2023 ඔක්තෝබර් 31 දින රු. 340,000 ක මුදලක් ගෙවා ඇති බව.	වර්ෂ 05 කට වරක් වරිපනම් බදු තක්සේරුව ප්‍රතිශෝධනය කළ යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

3.1 කළමනාකරණ අකායර්ක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් 6 ක රු.7,530,595 ක ශේෂයක් වූ අතර එම ශේෂය තුල අවුරුදු 1 ත් 5 ත් අතර රු.7,369,012 ක් හා වසර 5 කට වඩා පැරණි රු.161,637 ක් පැවතුණි. මෙම මුදල් අය කර ගැනීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි.	අයකර ගැනීමට සහ කපා හැරීමට කටයුතු සිදු කරන බව.	ලැබිය යුතු වටිනාකම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් 15 ක රු.32,284,844 ක ශේෂයක් වූ අතර , එම ශේෂ තුල වසර 1 ත් 5 ත් අතර කාලයට අදාළව රු.31,832,762 ක් හා වසර 5 කට වඩා පැරණි රු.452,082 ක් පැවතුණි. මේවායේ පැවැත්ම පිළිබඳව තහවුරු කර ගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	2024 වර්ෂයට අදාල ණයහිමි වටිනාකම් පමණක් වන අතර ගිවිසුම් ඇප හා ආරක්ෂිත ඇප ගිවිසුම් කාලය අවසන් වන තෙක් නිදහස් කළ නොහැකි බව.	තව දුරටත් තැන්පත් ලෙස රඳවාගත යුතු මුදල් හැර අනෙකුත් ගෙවිය යුතු මුදල් පියවා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	2024 වර්ෂය තුළදී අනවසර ඉදිකිරීම් පැමිණිලි 32 ක් ලැබී තිබුණු අතර ඉන් පැමිණිලි 16 ක් සම්බන්ධයෙන් කිසිඳු ක්‍රියාමාර්ගයක් ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි.	2024 වර්ෂය තුළ ලද අනවසර ඉදිකිරිම් සම්න්ධයෙන් ස්ථානීය පරීක්ෂාවක් සිදු කොට ලිපි යොමු කර විසඳුම් ලබා දී ඇති අතර තවත් කිහිපයක් සම්බන්ධයෙන් ස්ථානයේදී විසඳුම් ලබා දී ඇති බව.	පැමිණිලි සඳහා නිසි විසඳුම් ලබා දීමට කටයුතු කළ යුතුය.
(ඈ)	1989 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 59, 60 හා 67 වගන්ති ප්‍රකාරව 2024 වර්ෂයට අදාළව කර්මාන්ත හා වෙළඳ ව්‍යාපාර පිළිබඳ ලැයිස්තුවක් පිළියෙල කර එය 2024 මාර්තු31 දිනට හෝ ඊට පෙර සභාවේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කර නොතිබුණ අතර එහි 65 හා 67 වගන්ති ප්‍රකාරව	ඉදිරියේදී මෙම ලේඛන පිළියෙල කිරීමට කටයුතු කරන බව.	1989 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය.

	ගෙවීම් පැහැර හරින අයගේ නාම ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.		
(ඉ)	2019 ජනවාරි 10 දිනැති අංක 2019/02 දරණ පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයෙහි 15 වන වගන්තිය ප්‍රකාරව පළාත් පාලන ආයතනයේ පූර්ව හා ලිඛිත අනුමැතියකින් තොරව බදු අයිතිය පැවරීම නොකළ යුතු වුවත් අලව්ව පොදු වෙළඳසැල කඩ කාමර 28 ක් සම්බන්ධයෙන් සිදු කළ භෞතික පරීක්ෂාවේදී කඩ කාමර අංක 04, 12, 18, 19, 21, හා 23 යන කඩ කාමර 06 අතුරු බදු ලබා දී තිබුණි. ඒ සම්බන්ධයෙන් චක්‍රලේඛයේ 18 වන වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	චක්‍රලේඛයේ 18 ප්‍රකාරව කටයුතු කිරීමට ඉදිරියේදී පියවර ගන්නා බව.	චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කල යුතුය.

3.2 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සභාව සතු ඉඩම්, ගොඩනැගිලි සහ වාහන සඳහා පමණක් ස්ථාවර වත්කම් ලේඛන පවත්වාගෙන යන අතර අනෙකුත් ස්ථාවර වත්කම් සඳහා ලේඛන පවත්වා නොතිබුණි.	කාර්යාලිය උපකරණ ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කිරීමට කටයුතු කරන බව.	ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීනව පැවැත්විය යුතුය.
(ආ)	සභාව සතු ඉඩම් 66 න් ඔප්පු ඇති පිඹුරුපත් නොමැති ඉඩම් 46 ක්, ඔප්පු සහ පිඹුරුපත් නොමැති ඉඩම් 14 ක් හා ඔප්පු නොමැති හා පිඹුරුපත් ඇති ඉඩම් 03 ක් තිබුණු අතර මෙම ඉඩම්වල අයිතිය සහ ප්‍රමාණයන් විධිමත් පරිදි තහවුරු කරගෙන නොතිබුණි. තවද සභාව භාවිතයට ගනු ලබන සුසානභූමි 63 ක අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.	පවරානොගත් ඉඩම් සභාවට පවරා ගැනීමට සහ ඉඩම්වල අයිතිය තහවුරු කර ගැනීම සඳහා අදාළ ඔප්පු සහ පිඹුරුපත් ලබා ගැනීමට කටයුතු කරන බව මීට අමතරව සුසානභූමි 63 හි අයිතිය පවරා දෙන ලෙස ප්‍රාදේශීය ලේකම්ගෙන් ඉල්ලීම් කර ඇති බව.	අයිතිය සහ ප්‍රමාණයන් විධිමත් පරිදි තහවුරු කරගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	සභාවේ ඉඩම්වල වැට මායිම් යොදා සභාවේ නාම පුවරු සවිකර ඒවායේ ආරක්ෂාව තහවුරු කළ යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි.	දවටගොල්ල/ පන්නල සුසාන භූමිවල වැටවල් ගසා දැනට ආරක්ෂාව තහවුරු කර ඇත. ඉදිරියේදී වැට මායිම් යොදා , නාම පුවරු යොදා ආරක්ෂාව තහවුරු කරන බව.	ඉඩම්වල ආරක්ෂාව තහවුරු කළ යුතුය.

3.3 ව්‍යාපෘති, කතර්ව්‍යන් හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වටිනාකම රු. 950,000 ක් වූ අයවැයගත ප්‍රතිපාදන වෙන් කර තිබුණු වැඩසටහන් 07 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.	පිරිවිතර නොමැති වීමත් භාණ්ඩ එම අවස්ථාවේ එම ආයතන තුල නොතිබීමත් හේතුවෙන් එම වර්ෂය තුල එය ලබා ගැනීමට නොහැකි වූ බව.	වර්ෂය තුල ඉටුකළ යුතු ව්‍යාපෘති නිවැරදිව හඳුනාගෙන අයවැයගත ප්‍රතිපාදන වෙන් කළ යුතුය.

(ආ)	ප්‍රජා සංවර්ධන අංශය විසින් ක්‍රියාත්මක කර තිබුණු වැඩසටහන් 02 ක සියයට 07 හා සියයට 36 ක තරම් අඩු භෞතික ප්‍රගතියක් අත් කර ගෙන තිබුණි.	ආධාර ලාභීන් වැසිකිළි සෑදීම ප්‍රමාද කළ නිසා හා මැතිවරණ තත්ත්වය නිසා පූර්ණ තත්වයට ලගා වීමට නොහැකි වූ බව.	ඉලක්කගත ප්‍රගතිය ළඟා කර ගැනීමට කටයුතු කළ යුතුය.

3.4 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සභාවේ අනුමත කාර්යමණ්ඩලයේ පුරප්පාඩු 05 ක් හා අතිරික්ත 19 ක් පැවති අතර අනුමත කාර්යමණ්ඩල ඉක්මවා අනියම්, ආදේශක, කොන්ත්‍රාත් හෝ දෛනික දීමනා පදනම යටතේ බඳවා ගත් සේවකයින් 04 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ වැටුප් හා දීමනා ලෙස රු.2,600,570 ක් ගෙවීම් කර තිබුණි.	ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ සේවය කරන සේවක මහතුන් ප්‍රමාණවත් නොවන හෙයින් දෛනික පදනම මත සෞඛ්‍ය කම්කරුවන් තිදෙනෙකු බඳවා ගෙන ඇති බව.	පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් සිදුකළ යුතු අතර අතිරික්ත කාර්යමණ්ඩලය අනුමත කරවාගත යුතුය.
(ආ)	රියදුරු තනතුරේ රාජකාරි ආවරණය සඳහා නිලධාරීන් 05 දෙනෙකු පත්කර තිබුණු අතර, වෙනත් තනතුරුවල තිදෙනෙකු හටද රියදුරු රාජකාරි පවරා තිබුණි. ඒ අනුව සභාව සඳහා අනුමත රියදුරු නිලධාරීන් සංඛ්‍යාව ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය කෙරේ.	වාහන 14ක් පවතින අතර අනුමතව ඇත්තේ රියදුරු 04ක් පමණි. එබැවින් පවතින වාහන සංඛ්‍යාව සඳහා රියදුරු සංඛ්‍යාව ප්‍රමාණවත් නොවන බැවින් වෙනත් තනතුරුවල සේවක මහතුන් රියදුරු තනතුරේ රාජකාරි ආවරණය සඳහා යොදවා ඇති බව.	අවශ්‍ය නිලධාරීන් ප්‍රමාණය අනුමත කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	සභාවේ ආදායම් පරීක්ෂක නිලධාරීන් තිදෙනෙකු පුරප්පාඩුව පැවතීම ආදායම් අයවීම ආකාර්යක්ෂම වීමට බලපා ඇති බව නිරීක්ෂණය විය.	සභාවේ ආදායම් පරීක්ෂක තනතුරේ පුරප්පාඩු 03ක් පවතින අතර , ඒ සම්බන්ධයෙන් අදාළ අංශ මේ වන විට දැනුවත් කර ඇති බව.	පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් සිදුකළ යුතුය.

3.5 වාහන පද්ධති කළමනාකරණය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සභාව සතු ට්‍රැක්ටර් රථයක් 2023 දෙසැම්බර් 31 දින සිට ධාවන තත්ත්වයේ නොපවතුණි.	2025 වර්ෂයේ මේ වන විට එහි අලුත්වැඩියා කටයුතු සිදු කරමින් පවතින බව.	සභාවේ වත්කම් සඵලදායීව උපයෝජනයට ක්‍රියා කළ යුතුය.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම තුළ පිහිටුවන ලද එක් එක් ක්‍රියාකාරකම් ළඟා කර ගැනීමට අදාළව නිශ්චිත කාල රාමුවක් සහ මූලික අරමුණ සාක්ෂාත් කර ගැනීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා ස්ථාපිත කළ යුතු කාර්යසාධන දර්ශක (KPI) පිහිටුවා නොතිබුණි.	2025 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර ඇති බව.	නිවැරදිව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතුය.

4.2 අයවැය පාලනය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ ආදායම් විෂයන් 05 ක අයවැයගත ආදායම හා සත්‍ය ආදායම අතර සියයට 2 ත් සියයට 29 ත් අතර විචලනයක් හා වියදම් විෂයයන් 08 ක අයවැය ගත ප්‍රතිපාදනය හා සත්‍ය වියදම අතර සියයට 18 ත් 74 ත් අතර විචලනයක් පැවතුණි. ඒ අනුව අයවැය ලේඛනය ඵලදායී කලමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.	පුහුණු සැසි අපේක්ෂිත ප්‍රමාණයට වඩා අඩු වීම ඇතැම් පුහුණු වැඩසටහන් මාර්ග ගත ක්‍රමයට පැවැත්වීම, වර්ෂය මැදදී ඉන්ධන මිළ පහළ දැමීම හා සැපයුම් උපකරණ සඳහා වැය කරන මුදල් පාලනය කිරීමට උපදෙස් ලැබීම වැනි හේතු නිසා මෙම විචල්‍යතාවයන් පැවති බව.	අයවැයගත අගයන් හා සත්‍ය අගයන් අතර විචලනයන් අවම කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	වාර්ෂික අයවැය මගින් රු.1,600,000 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණු කර්මාන්ත 04 ක් සමාලෝචිත වර්ෂය තුලදී ඉටුකර නොතිබුණි.	වාර්ෂික අයවැය මගින් රු.1,600,000 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණු කර්මාන්ත සමාලෝචිත වර්ෂය තුලදී ඉටු කල නොහැකි වූ බව.	ප්‍රදේශයේ ජනතාවගේ අවශ්‍යතා ඉටු කිරීම වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කර ඒවා ක්‍රියාත්මක කිරීමට ක්‍රියාකළ යුතුය.

4.3 තිරසාර සංවර්ධන අරමුණු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සභාව විසින් තිරසර සංවර්ධන අරමුණු ලෙස 2030 වනවිට ලෝකයේ සියලුම ස්ථානවල වෙසෙන පුද්ගලයින්ගේ අන්ත දරිද්‍රතාවය තුරන් කිරීම වැනි සභාවට ළඟාවිය නොහැකි ඉලක්ක ස්ථාපිත කර තිබුණු අතර, සභාවට ප්‍රායෝගික වූ තිරසර සංවර්ධන අරමුණු හඳුනා ගැනීම කෙරෙහි අවදධානය නොතිබුණි.	අයවැය ප්‍රතිපාදන වෙන් කර ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් කර තිබේද යන්න හා තිරසර අරමුණු ඉටුකර ගැනීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ ඉටුකල ව්‍යාපෘති දක්වා යොමු වී.	ප්‍රායෝගික වූ තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක ළඟා කර ගැනීමට ක්‍රියා කළ යුතුය.